**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝගය සංරචකය - 2017**

---

නව මූල්‍යයන ආකෘතිය යටතේ(එන්එෆ්එම්)ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ(ජීඑෆ්ඒටීඑම්) ක්ෂය රෝගය සංරචකයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 857-එල්කේඒ-ටී-එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුමේ 1(ඇ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අඩු පහසුකම් ලබන ප්‍රදේශයන්හි ව්‍යාපෘති ක්‍රියාකාරිත්වය ඉහල නැන්වීම සහ රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය ප්‍රවර්ධනය කිරීම තුලින් ඍජුව නිරීක්ෂණය කළ කෙටි කාලීන (DOTS) වැඩසටහන්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්ෂය රෝගය පාලන වැඩසටහන් සවිබලගැන්වීම වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, නව මූල්‍යයන ආකෘතිය යටතේ දැඩි ක්ෂය රෝගය පාලනය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 7.91ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 31වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා

විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 මූල්‍ය කාර්යසාධනය

-----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ පිරිවැය එජඩො 1,588,806 කට සමාන රු.242,228,920 සහ 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 358,630,817 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පෙර වර්ෂය සඳහා වියදම සහ 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත සාරාංශ කර දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2017 | | 2016 | | |
| | එජඩො | රු. | එජඩො | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 169,801 | 25,887,480 | 16,121 | 2,475,850 | 28,363,330 |
| ක්ෂය රෝගය පාලන කටයුතු | 1,419,005 | 216,341,440 | 782,480 | 113,926,047 | 330,267,487 |
| එකතුව | **1,588,806** | **242,228,920** | **798,601** | **116,401,897** | **358,630,817** |

### 2.2.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

-----------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහ පෙර වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා | |
|---|---|---|---|---|
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| විදේශ ආධාර - ප්‍රදානවලින් ලද මුදල් | 1,181,871 | 180,188,023 | 720,805 | 104,822,167 |

| | | | | |
|---|---|---|---|---|
| දේශීය අරමුදල්වලින් ලද මුදල් | 92,281 | 14,069,151 | 13,587 | 1,602,826 |
| වෙනත් ආදායම් | 154 | 23,500 | 234 | 34,000 |
| ඍජු වියපැහැදම් | 357,473 | 54,500,287 | - | - |
| විදේශ විනිමය අලාභය සඳහා ගැලපීම් | | | (1,399) | - |
| වැඩසටහන් වියදම් සඳහා මුදල් ගෙවීම් | (1,419,005) | (216,341,440) | (782,480) | (113,929,047) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | 212,774 | 32,439,521 | (49,253) | (7,470,054) |
| විදේශ විනිමය අලාභය / ලාභය | 615 | - | - | - |
| ක්ෂය | 47,805 | 7,288,395 | 63,628 | 9,649,938 |
| පාරිතෝෂික | 9,630 | 1,468,216 | 38,921 | 5,902,909 |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික | (4,702) | (716,800) | - | - |
| ගෙවිය යුතු ශේෂ වැඩිවීම | 90,559 | 11,634,403 | (35,690) | (5,412,688) |
| ලැබිය යුතු ශේෂ වැඩිවීම | (180,059) | (25,194,165) | - | - |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් | **176,622** | **26,919,570** | **17,606** | **2,670,105** |
| **ආයෝජන කටයුතුවලින් ජනනය මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් | (169,801) | (25,887,480) | (16,325) | (2,475,850) |
| ආයෝජන කටයුතුවල යොදාගත් ශුද්ධ මුදල් | **(169,801)** | **(25,887,480)** | **(16,325)** | **(2,475,850)** |
| **මූල්‍ය කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | - | - |
| මුදල් අමාත්‍යාංශය වෙත හරවා යැවූ මුදල් | (6,821) | (1,032,090) | - | - |
| නොපියවූ අත්තිකාරම් | - | - | (1,281) | (194,254) |
| මූල්‍ය කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් | **(6,821)** | **(1,032,090)** | **(1,281)** | **(194,254)** |
| **මුදල්වල ශුද්ධ වැඩිවීම/ ශුද්ධ අඩුවීම** | නැත | නැත | නැත | නැත |

### 2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් හේතු නිසා ලබාදෙන ලද මුදල් අත්තිකාරම් සම්බන්ධයෙන් මූල්‍ය පාලනයන් ප්‍රමාණවත් ලෙස ව්‍යාපෘතිය අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 371(5) සහ 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ කරන ලද ප්‍රතිපාදන වලට එරෙහිව අවස්ථා 31 දී රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 29.59 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ආ) තත්කාර්ය අතුරු අග්‍රිම විශේෂිත කාර්යයට පෙර ආසන්න දිනයකදී ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.මිලියන 2.91 ක අතුරු අග්‍රිම අවස්ථා 44 කදී නියමිත දිනයට දින 14 කට පෙර ලබාදී තිබුණි. තවද, අවස්ථා 36 කදී නිකුත් කරන ලද එකතුව රු.මිලියන 6.90 ක තත්කාර්ය අතුරු අග්‍රිම අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණු අතර මාස 01 සිට මාස 11 දක්වා ප්‍රමාදයන් සහිතව නිරවුල් තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 7.91 | 1,033.99 | 3.86 | 1.54 | 234.70 | 3.13 | 466.32 |
| ශ්‍රී ලං ර | - | - | - | 0.09 | 14.07 | 0.10 | 15.67 |
| එකතුව | 7.91 | 1,033.99 | 3.86 | 1.63 | 248.77 | 3.23 | 481.99 |

ඉහත සඳහන් තොරතුරු වලට අනුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී උපයෝජනය කිරීමට අපේක්ෂා කළ රු.මිලියන 1,033.99 කට සමාන එජඩො මිලියන 7.91 ක මුළු ප්‍රතිපාදනයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 481.99 කට සමාන එජඩො මිලියන 3.23 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ඉලක්ක ලඟාකර ගැනීමට අසමත්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කරන ලද රු.මිලියන 1.03 කට සමාන එජඩො 6,821 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 6.35 කට සමාන එජඩො 41,955 ක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට ආපසු හරවා යවා තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ප්‍රගතිය යාවත්කාලින කිරීම සහ ක්ෂය රෝගය සඳහා නව මූල්‍යයනය ආකෘතිය යටතේ වියපැහැදම් ඉල්ලීම් වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය පිරිවැය කාණ්ඩ 11 මඟින් අයවැය ක්‍රියාමාර්ග 446 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. අයවැය ක්‍රියාමාර්ග 05 ක් යටතේ රු.මිලියන 118.06 කට සමාන එජඩො 903,224 ක් සිදුකර තිබුණු අතර එයින් 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 33.86 කට සමාන එජඩො 259,059 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතිය වෙනත් අයවැය පිරිවැය කාණ්ඩ 03 ක් යටතේ කරන ලද රු.මිලියන 47.85 කට සමාන එජඩො 366,043 ක ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 17.68 කට සමාන එජඩො 135,263 ක් වියදම් කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලියාපදිංචි නොවූ ක්ෂය රෝගීන් හඳුනා ගැනීම, ඔවුන් ප්‍රතිකාර සඳහා යොමු කිරීම සහ රෝගීන් සඳහා සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්, හෙදියන්, වෛද්‍යවරුන් සහ අනෙකුත් අදාල පාර්ශවයන් පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 217 ක් පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු.මිලියන 17.3 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන් 120 ක් පමණක් පවත්වා තිබුණු අතර ඒ සඳහා එකතුව රු.මිලියන 7.10 ක් පමණක් වියදම් කර තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශය විසින් රෝගීන්ගේ වාර්තා පවත්වා ගැනීමේ ක්‍රමවේදයක හිඟකම සහ රෝගයේ ස්වභාවය පිළිබඳව අනාවරණය කිරීමට රෝගීන් මැලිකමක් දැක්වීම යනාදී හේතු කිහිපයක් නිසා ක්ෂය රෝගීන් පිළිබඳව සහ ඒ මත සිදුවූ මරණ සම්බන්ධයෙන් තොරතුරු රේඛීය අමාත්‍යාංශයේ නොතිබුණ බව විගණනයේදී අනාවරණය විය.

### 3.3 මූල්‍ය පාලනයට අදාල ගැටලු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133 අනුව සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ ගනුදෙනු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනයවී නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට රු.මිලියන 25.42 කට සමාන එජඩො 167,992 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

### 3.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු

ව්‍යාපෘතිය කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යාතනයේ, යාපනය ශික්ෂණ රෝහලේ සහ කෑගල්ල දිස්ත්‍රික් ළය සායනවල භාවිතය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 21.66 ක පිරිවැයකට Gene Xpert යන්ත්‍ර 03 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. ප්‍රදාන ආයතනයේ අනුමැතිය ලැබීමෙන් පසු මාස 05 ක ප්‍රමාදයක් සහිතව 2017 අගෝස්තු 10 දින ඒ සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, එම යන්ත්‍ර තෝරාගත් ලංසුකරුවන් විසින් සැපයීමට එකඟවූ දින සිට සති 04 සිට සති 06 ක පරාසයක ප්‍රමාදයක් සහිතව 2017 දෙසැම්බර් 27 දින සහ 2018 ජනවාරි 11 දින සපයා තිබුණි. තවද, ව්‍යාපෘති නියාමන ඒකකය කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට සහ ඒ සඳහා නිදහස් කරන ලද රු.මිලියන 2.20 ක අත්තිකාරම් මුදල වෙනුවෙන් ඇප බැඳුම්කරයක් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝගය සඳහාවූ නව මූල්‍යයන ආකෘතිය සංරචකයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් වෙනම විගණන වාර්තාවක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට නිකුත් කර තිබුණු අතර ඒ මත තත්ත්වාගණනය කළ විගණන මතයක් පළ කර තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා විගණකාධිපතිවරයාගේ එකඟතාවය ඉල්ලා නොතිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලයේ ක්ෂය රෝග සහයකවරුන් 80 දෙනෙකුගෙන් සමන්විතවී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 60 දෙනෙකු පමණක් සේවයේ නියුතුව තිබුණි. ක්ෂය රෝග සහයකවරුන්ගේ හිඟකම හේතුවෙන් දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථාන, රසායනාගාර සහ අන්වීක්ෂ විමර්ෂණ මධ්‍යස්ථානවල කාර්යයන් තෘප්තිමක් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි. තවද, වතු සම්බන්ධීකාරකවරුන්ගේ තනතුරු 10 ක් සහ දත්ත ඇතුලත්කරන්නන්ගේ තනතුරු 09 ක් 2017 දෙසැම්බර් 31 දිනට ආසන්න වශයෙන් අවුරුදු 02 ක් පුරා පුරප්පාඩුව පැවතුණි.